7786

AL/2015/54/S-I

සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

පෙරදිග සංගීතය I
கீழைத்தேய சங்கீதம I
Oriental Music I

54 S I

පැය දෙකයි
இரண்டு மணித்தியாலம்
Two hours

විභාග අංකය : ...........................

පරීක්ෂකවරුන්ගේ ප්‍රයෝජනය සඳහා

| පිටු අංකය | ප්‍රශ්න අංක | ලකුණු |
|---|---|---|
| 01 | 01 - 07 | |
| 02 | 08 - 20 | |
| 03 | 21 - 33 | |
| 04 | 34 - 50 | |
| එකතුව | | |

| | අත්සන | සංකේත අංකය |
|---|---|---|
| 1 වන පරීක්ෂකගේ | | |
| 2 වන පරීක්ෂකගේ | | |
| අති / ප්‍රධාන පරීක්ෂකගේ | | |
| ගණිත පරීක්ෂකගේ | | |
| ප්‍රධාන පරීක්ෂකගේ | | |

**උපදෙස්:**
* **සියලු ම** ප්‍රශ්නවලට පිළිතුරු මෙම ප්‍රශ්න පත්‍රයේ ම සැපයිය යුතු ය.

- ප්‍රශ්න අංක **1** සිට **39** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු සැපයීමේ දී නිවැරදි හෝ ඉතා ම ගැළපෙන හෝ පිළිතුර තෝරා ඊට අදාළ **අංකය** ප්‍රශ්නය ඉදිරියෙහි ඇති **වරහන තුළ** ලියන්න.

**1.** මේලයක අඩංගු වන්නේ,
(1) ආරෝහණ ස්වර පමණි.  (2) වාදි සංවාදි ස්වර පමණි.
(3) අනුවාදි ස්වර පමණි.  (4) විවාදි ස්වර පමණි.
(5) විකෘති ස්වර පමණි.  (......)

**2.** ජෞනපුරි රාගයේ සමප්‍රකෘති රාගය වන්නේ,
(1) භීම්පලාසි ය.  (2) ආසාවරි ය.  (3) කාලිංගඩා ය.
(4) මාල්කෞන්ස් ය.  (5) හමීර් ය.  (......)

**3.** රාග ජාතිය පිළිබඳ විවිධ මත තුනක් දැක්වෙන්නේ,
(1) බ්‍රින්දාබනී සාරංග රාගයේ ය.  (2) දේස් රාගයේ ය.
(3) බාගේශ්‍රී රාගයේ ය.  (4) තිලක්කාමෝද් රාගයේ ය.
(5) බිහාග් රාගයේ ය.  (......)

**4.** රි, ප ස්වර වාදි, සංවාදි වශයෙන් යෙදෙන රාග යුගලයක් වන්නේ,
(1) බාගේශ්‍රී සහ මාල්කෞන්ස් ය.  (2) භීම්පලාසි සහ බ්‍රින්දාබනී සාරංග ය.
(3) බහාර් සහ හමීර් ය.  (4) තිලක්කාමෝද් සහ දේස් ය.
(5) බිහාග් සහ ජයජයවන්ති ය.  (......)

**5.** නි ධ ප, ම ප ගු, ම ගු රි, ස යන ස්වරමාලාව කුමන රාගයකට අයත් වේ ද?
(1) භීම්පලාසි  (2) ජයජයවන්ති  (3) බ්‍රින්දාබනී සාරංග
(4) දේස්  (5) මාල්කෞන්ස්  (......)

**6.** 'ගීත ගෝවින්ද' නමැති සංගීතමය පද්‍ය ග්‍රන්ථය රචනා කළ සංගීතඥයා තෝරන්න.
(1) භාත්ඛණ්ඩේ පඬිතුමා  (2) සාරංගදේව පඬිතුමා
(3) සංගීතඥ අමීර්කුශ්රූ  (4) පණ්ඩිත් රවිශංකර්
(5) මහාකවි ජයදේව  (......)

**7.** පංකජ් උදාස් සහ ජග්ජිත් සිංග් යන ප්‍රවීණ භාරතීය ගායන ශිල්පීන් ප්‍රසිද්ධියක් ඉසිලූ ගායන ශෛලිය කුමක් ද?
(1) ඛ්‍යාල්  (2) ගසල්  (3) වර්ණම්  (4) තිල්ලානා  (5) තරාණා  (......)

[ දෙවැනි පිටුව බලන්න.

**34.** නාද ශ්‍රවණය සඳහා අදාළ **නොවන** ඉන්ද්‍රියක් වන්නේ,
(1) යුෂ්ටේකීය නාලය ය. (2) තිසාතිය අස්ථිකාව ය.
(3) කොක්ලියර් ස්නායුව ය. (4) ස්වර තන්තු ය.
(5) අර්ධ කවාකාර නාල ය. (......)

● අංක **35** සහ **36** ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත සඳහන් පෙරදිග ස්වර ප්‍රස්තාරය අදාළ කරගන්න.

| ග ප – ග | ම – ස – | නි + ප – | ග + ස – |

**35.** ඉහත ස්වර රචනාව සඳහා වඩාත් ම උචිත බටහිර කෝඩ්ස් (chords) **හතර** පිළිවෙළින් තෝරන්න.
(1) C F G C (2) C C G C (3) F G C C (4) G F G C (5) G F F C (......)

**36.** ඉහත ස්වරමාලාවට ගැළපෙන කවුන්ටර් මියුසික් (counter music) ඛණ්ඩය තෝරන්න.
(1) | ම – – – | ම – – – | ස̇ – – නි | ම – – – |
(2) | ම – – – | ධ – – – | ස̇ – – ධ | ම – – – |
(3) | ස̇ – – – | ධ – – – | රි̇ – – නි | ප – – – |
(4) | රි̇ – – – | නි – – – | ම̇ – – ග̇ | රි̇ – – – |
(5) | ග̇ – – – | නි – – – | ම̇ – – ග̇ | ස̇ – – – | (......)

**37.** මිනිස් මොළයේ දකුණු අර්ධ ගෝලය හා සම්බන්ධතාවක් ඇති විෂය තෝරන්න.
(1) කථාව (2) භාෂාව (3) තර්කණය (4) කලාව (5) ගණිතය (......)

**38.** 'මානසවිල' සහ 'අග්නි' යන ශ්‍රී ලාංකික ඔපෙරා නිර්මාණය කරන ලද්දේ කවුරුන් විසින් ද?
(1) ආචාර්ය ලෙස්ටර් ජේම්ස් පීරිස් සූරීන් (2) මහාචාර්ය එදිරිවීර සරච්චන්ද්‍ර සූරීන්
(3) ආචාර්ය ප්‍රේමසිරි කේමදාස සූරීන් (4) සංගීතවේදී සෝමදාස ඇල්විටිගල සූරීන්
(5) සංගීතවේදී ඩබ්ලිව්. බී. මකුලොලුව සූරීන් (......)

**39.** දක්ෂිණ භාරතීය කර්ණාටක සංගීත පද්ධතිය අනුව
(1) ප්‍රධාන තාල 9 කි, ජාති 3 කි. (2) ප්‍රධාන තාල 8 කි, ජාති 4 කි.
(3) ප්‍රධාන තාල 7 කි, ජාති 5 කි. (4) ප්‍රධාන තාල 6 කි, ජාති 6 කි.
(5) ප්‍රධාන තාල 5 කි, ජාති 7 කි. (......)

● අංක **40** සිට **44** තෙක් ප්‍රශ්නවලට පිළිතුරු දීම සඳහා පහත ඡේදය උපයෝගී කරගෙන අදාළ හිස්තැන්වලට සුදුසු පිළිතුරු ලියන්න.

පාසලේ විවිධ ප්‍රසංගයේ දී රාගධාරී ශාස්ත්‍රීය ගායනයක් ඉදිරිපත් කිරීමට සුනිමල්ට අවස්ථාවක් ලැබුණි. **ම̣ ස ස ධ̣** යන ස්වර පිළිවෙළට තාම්පුරාව සුසර කොට සුනිමල් විසින් ඉදිරිපත් කළ ගායනය විවිධ ලය අනුව ගුණ කරන ලදී. ඒ සඳහා තබ්ලාවෙන් සහාය වාදනය සැපයූ සිසුවා ඒක්තාලයෙහි මිතියට සමාන **(40)**. ........... තාලය වාදනය කළේ ය. ඒක් තාලය තබ්ලා අංගයේ අක්ෂර භාවිතයෙන් වැයුනද එම තාලය වැයුවේ **(41)**. ............... අංගයේ අක්ෂර භාවිතයෙනි. සුනිමල් ඉදිරිපත් කළේ **(42)**. ............... ගායන ශෛලියට අයත් ගීතයකි. ඔහු යොදා ගත් **(43)**. ............ රාගයේ රිෂභය හා පංචමය වර්ජිත ය. **(44)**. ............... ගායන ශෛලියේ දී මෙන් තානාලංකාර යොදා නොගැනීම ද සුනිමල් ඉදිරිපත් කළ ගායන ශෛලියේ විශේෂත්වයකි.

**45.** "ඕලු පිපීලා විල ලෙළ දෙනවා" ගීතය ගයන ලද්දේ ............................................................ සූරීන් විසිනි. "එන්ඩද මැණිකේ මමත් දියඹටා" ගීතය නිර්මාණය කරන ලද්දේ ............................................ සූරීන් විසිනි.

**46.** සරල ගීයක යෙදෙන සංගීතාංග දෙකකි, පෙර වාදනය (introduction), සහ කවුන්ටර් පොයින්ට් (counterpoint). එවන් තවත් අංග **දෙකක්** නම් කරන්න.
(1) ..................................................... (2) ..............................................................

**47.** ජාවා සහ සුමාත්‍රා යන දූපත්වලින් බිහි වූයේ .................................. සංගීතයයි. ඉස්ලාමීය සංගීතය බිහි වූයේ ............................. රටවලිනි.

**48.** 'හෙළ ගී මග' ................................................ විසින් රචනා කරන ලද ග්‍රන්ථයකි. එහි අන්තර්ගත වන්නේ ........................................ සංගීතයට අදාළ ගී හා ස්වර ප්‍රස්තාර ය.

**49.** 'ප්‍රේමයෙන් මන රංජිත වේ' සහ 'දූලා නෙතු පූලා' යන නව නාට්‍ය ගීත ඇතුළත් වනුයේ .................................. නාට්‍යයෙහි ය. එහි නිෂ්පාදකවරයා වන්නේ ........................................ සූරීන් ය.

**50.** වෛද මන්ත්‍ර ගායනාවල දී භාවිත වූ ප්‍රධාන ස්වර තුන හඳුන්වනු ලබන්නේ ..................................., අනුදාත්ත සහ .................................. යනුවෙනි.

* * *

1786



සියලු ම හිමිකම් ඇවිරිණි / முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved]

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව
இலங்கைப் பரீட்சைத் திணைக்களம் இலங்கைப் பரீட்சைத் திணைக்களம்
Department of Examinations, Sri Lanka Department of Examinations, Sri Lanka

අධ්‍යයන පොදු සහතික පත්‍ර (උසස් පෙළ) විභාගය, 2015 අගෝස්තු
கல்விப் பொதுத் தராதரப் பத்திர (உயர் தர)ப் பரீட்சை, 2015 ஓகஸ்ற்
General Certificate of Education (Adv. Level) Examination, August 2015

| | | |
|---|---|---|
| පෙරදිග සංගීතය II<br>கீழைத்தேய சங்கீதம் II<br>Oriental Music II | 54 S II | පැය තුනයි<br>மூன்று மணித்தியாலம்<br>Three hours |

**උපදෙස්:**

※ I කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, **II** කොටසින් **එක්** ප්‍රශ්නයකට ද, **III** කොටසින් ප්‍රශ්න **දෙකකට** ද, වශයෙන් ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න. (සෑම ප්‍රශ්නයකට ම **ලකුණු 20** බැගින් ලැබේ.)

## I කොටස

**1.** (i) පහත සඳහන් 'ස්වර සංගතීන්' හඳුනාගෙන අදාළ රාග පිළිවෙළින් නම් කරන්න.

(a) ප නි̣ ස රි ග, ස රි ප ම ග, නි̣ ස

(b) ම ප නි ස̇, නි̲ නි̲ ප ම රි, නි̣ ස

(c) ග ම ප ස̇ නි ප ග ම ග, නි̣ ස

(d) නි̲ ධ ම ප ධ, ම ග රි ග ස, නි̣ ස (ලකුණු 08 යි.)

(ii) ඉහත රාග හතරෙන් රාග දෙකක් සමප්‍රකෘති ගණයට අයත් වේ. එම රාග **දෙක** නම් කොට, ඉන් **එක්** රාගයකට අයත් කෙටි ආලාප ඛණ්ඩයක් ස්වර **25** කට නොඅඩු වන සේ ලියන්න. (ලකුණු 04 යි.)

(iii) ආලාප නොලියූ ඉතිරි රාග තුනෙන් **එක්** රාගයකට අයත් මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ ලක්ෂණ ගීයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ස්වර ප්‍රස්තාර කොට, මාත්‍රා **අටකට** නොඅඩු තානාලංකාර **දෙකක්** තාලානුකූල ව ලියන්න. (ලකුණු 06 යි.)

(iv) ඉහත රාග හතර තුළ ඇති තීව්‍ර මධ්‍යමය සහිත රාගයෙහි මේලය සහ වාදි, සංවාදි ස්වර ලියන්න. (ලකුණු 02 යි.)

**2.** (i) පහත වගුවෙහි දැක්වෙන රාග නාම යටතේ **A, B, C** වශයෙන් ස්වර සංගති පෙළගස්වා ඇත්තේ අදාළ රාගයට **නො ගැළපෙන** සේ ය. එම ස්වර සංගති ඒ ඒ රාග නාම යටතේ **A, B, C** තීරුවල පිළිවෙළට ගළපා ලියන්න.

| රාග නාම | A | B | C |
|---|---|---|---|
| බහාර් | ස ග̲ ම ධ නි̲ ස̇ | ස̇ ධ̲ නි̲ ධ̲ ම | ම ග̲ රි ස |
| බාගේශ්‍රී | ස ග̲ ම ධ̲ නි̲ ස̇ | ස̇ නි̲ ප ම ප | ග̲ ම ග̲ ස |
| හමීර් | ස ග̲ ම ධ නි ස̇ | ස̇ නි ධ ම' ප | ග̲ ම රි ස |
| මාල්කෞන්ස් | ග ම ධ නි ධ ස̇ | ස̇ නි̲ ධ ම ග̲ | ග ම රි ස |

(ලකුණු 08 යි.)

(ii) ඉහත නිවැරදි ව සකස් කළ ඕනෑම ස්වර සංගති පාද **දෙකක්** තෝරා ගෙන, ඉන් **එකක්** ත්‍රිතාලයට ද, **අනෙක** දීප්චන්දි තාලයට ද ගැළපෙන සේ ස්වර ප්‍රස්තාර කරන්න. එක් තාලයකට (තාල සංකේත සහිත ව) එක් ආවර්තයක් සෑහේ. (ලකුණු 06 යි.)

(iii) වගුවේ ඇති ඖඩව ජාති රාගය නම් කර, ඒ ඇසුරෙන් සරල ස්වර පල්ටාවක් උච්ච 'ස̇' දක්වා ගොඩනගා එහි අවරෝහණය ද ලියන්න. (ලකුණු 02 යි.)

(iv) වාදි ස්වරය හා සංවාදි ස්වරය එක ම අයුරෙන් යෙදෙන රාග **දෙකක්** වගුව තුළින් නම් කර, ඉන් **එක්** රාගයකට අදාළ මේලය, ආරෝහණය, අවරෝහණය, ජාතිය, වාදි, සංවාදි ලියන්න. (ලකුණු 04 යි.)

**3.**

**A** - ධා තිං තිං තා
**B** - ධා ධා තිං තිං
**C** - ධා ධා ධිං s
**D** - ති ට තා s

ඉහත දැක්වෙනුයේ නිර්දේශිත තාල හතරක විවිධ ස්ථානවලින් උපුටා ගත් මාත්‍රා හතර බැගින් යුත් විභාග හතරකි.

(i) මෙම තාල **හතර** හඳුනාගෙන පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 04 යි.)

(ii) ඉන් තාල **දෙකක්** තාලානුකූල ව සමගුණයෙන් ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(iii) **B** සහ **D** තාල දෙක යොදා ගැනෙන උත්තර භාරතීය ගායන ශෛලීන් **දෙක** පිළිබඳ සංගීතමය කරුණු **තුන** බැගින් ලියන්න. (ලකුණු 06 යි.)

(iv) කෝමල ස්වර **දෙකක්** සහිත නිර්දේශිත රාග **දෙකක්** නම් කර, ඉන් **එක්** රාගයකට අදාළ මධ්‍යලය ඛ්‍යාල ගීයක හෝ සර්ගමයක හෝ වාදිතයක හෝ ස්ථායි කොටස ඉහත ගැළපෙන **එක්** තාලයකට අනුව ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 06 යි.)

[දෙවැනි පිටුව බලන්න.

## II කොටස

**4.** පහත දැක්වෙනුයේ දේශීය ජන ගී කිහිපයක මුල් ගී පාද අටකි.

- ⁕ වරමති සුභ චරිතේ
- ⁕ කළුගල් තලාලයි පාරට දමන්නේ
- ⁕ කපන කොටන බිම පෙරළන
- ⁕ ගුණ දැනේ බෝසත් අනේ
- ⁕ පැහැසරණිය මිණි පැමිණිය කොත් අගට
- ⁕ මොහු හැර වෙන දන් ගන්නෝ නැද්දෝ
- ⁕ ඇත එපිට දීපංකර මුනි විවරණ ගන්නේ
- ⁕ කළුවන් කළු රුවයි මංගෝ දිලිසෙනවා

(i) ඉහත ගී පාද, සේ ගී හා ගැමි ගී වශයෙන් වෙන් කර ලියා දක්වන්න. (ලකුණු 04 යි.)

(ii) සේ ගී හා ගැමි ගී පිළිබඳ කරුණු **හතරක්** ඔස්සේ සංසන්දනයක් කරන්න. (ලකුණු 04 යි.)

(iii) "ඇත එපිට දීපංකර මුනි විවරණ ගන්නේ" හා "ගුණ දැනේ බෝසත් අනේ" යන ගී පාද කුමන ගී වර්ගවලට අයත් දැ'යි හඳුන්වා, එම ගී වර්ග **දෙක** පිළිබඳ කරුණු **තුන** බැගින් ලියන්න. (ලකුණු 06 යි.)

(iv) ඉහත වගුවේ ඇතුළත් අනාඝාතාත්මක මෙහෙ ගී පාදයක් තෝරා, එම ගී වර්ගය පිළිබඳ සංගීතමය කරුණු **හතරක්** ලියන්න. (ලකුණු 04 යි.)

(v) ඉහත වගුවේ ඇතුළත් ඕනෑම ආඝාතාත්මක ගී පාදයක් තාලානුකූල ව පද ප්‍රස්තාර කරන්න. (ලකුණු 02 යි.)

**5.** ශ්‍රී ලංකාවේ ප්‍රචලිත රංග සම්ප්‍රදායන් තුනකට අයත් තොරතුරු කිහිපයක් පහත දැක්වේ.

**A** - ගී තනු රටා උඩරට ශාන්තිකර්ම හා සම්බන්ධ වේ.
**B** - මද්දල දෙකකින් අඩුතාල් හා වැඩිතාල් වාදනය කෙරේ.
**C** - කථා පුවත පත්තිනි දෙවියන් හා සම්බන්ධ වේ.
**D** - විශ්වනාත් ලෞජී සූරීන් ගී තනු නිර්මාණය සඳහා විශාල වශයෙන් දායක වී ඇත.
**E** - "වාසනා දිනේකි මේක පාමූ තුටින්" ප්‍රචලිත ගී ඛණ්ඩයකි.
**F** - ගී තනු සඳහා කතෝලික කන්තාරු හා පසම් නාදමාලා බලපා ඇත.

(i) ඉහත තොරතුරු අදාළ රංග සම්ප්‍රදා නාම **තුන** යටතේ බෙදා වගුගත කරන්න. (ලකුණු 06 යි.)

(ii) එම රංග සම්ප්‍රදායන් **දෙකක්** පිළිබඳ කරුණු **පහකින්** යුත් සංසන්දනාත්මක විස්තරයක් පහත සඳහන් ශීර්ෂ ද අදාළ කරගනිමින් ලියන්න.

● සංගීතමය ලක්ෂණ ● රංගන ශෛලිය හා සංස්කෘතික ලක්ෂණ (ලකුණු 05 යි.)

(iii) ඉහත සම්ප්‍රදායන් තුනෙන් **දෙකකට** අයත් ගීත **දෙකක්** තෝරා ගන්න. එම ගී දෙකෙහි මුල් ගී පාද **දෙක** වෙන වෙන ම පද ප්‍රස්තාරගත කරන්න. (ලකුණු 04 යි.)

(iv) ඉහත සම්ප්‍රදායන් තුනට අමතරව නිර්දේශිත ඕනෑම රංග සම්ප්‍රදායක් නම් කර, එහි නාට්‍යමය හා සංගීතමය ලක්ෂණ පිළිබඳ විස්තරයක් කරන්න. (කරුණු පහක් ප්‍රමාණවත් ය.) (ලකුණු 05 යි.)

## III කොටස

**6.** උදාහරණ සහිත ව පහත සඳහන් මාතෘකා **හතරක්** පිළිබඳ විස්තර ලියන්න.

(i) පංචතූර්ය වර්ගීකරණය
(ii) ගායනයේ දී ස්වරාලය ක්‍රියාත්මක වන අයුරු
(iii) තබ්ලා වාදනයක ඇතුළත් අංග පහක්
(iv) දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිය
(v) අපරදිග සංගීතඥ බීතෝවන්
(vi) විෂ්ණු නාරායන් භාත්ඛණ්ඩේ පඬිතුමා

(ලකුණු 05 × 4 = 20 යි)

[තුන්වැනි පිටුව බලන්න.


**7.** පහත දැක්වෙනුයේ ව්‍යවහාරික සංගීත නිර්මාණ කිහිපයකට අදාළ තොරතුරු සහිත වගුවකි.

| ගීතය | ගී විශේෂය | ගායනය | ස්වතන්ත්‍ර බව හෝ අනුකාරක බව | විශේෂ ලක්ෂණ |
|---|---|---|---|---|
| හෝපලු වන පෙත | සරල ශාස්ත්‍රීය ගී | A .................... | ස්වතන්ත්‍ර | B ................................ රාගය ඇසුරෙන් නිර්මාණය වීම |
| ගලන ගඟකි ජීවිතේ | C .............. | D ................. සහ ශිල්පී නාරද දිසාසේකර | E .............. | පණ්ඩිත් අමරදේව විසින් සංගීත අධ්‍යක්ෂණය කිරීම |
| මුළු ගතම වෙහෙසුණා | කණ්ඩායම් ගී | ශිල්පී ජෝ පෙරේරා සහ පිරිස | F .............. | කැලිප්සෝ වර්ගයට අයත් වීම |
| පෙම් කැකුළ පිපී | G ............... | ශිල්පිනී ජමුනා රාණි සහ ශිල්පී ඒ. එම්. රාජා | H .............. | දකුණු ඉන්දීය ශිල්පීන් විසින් ගායනා කිරීම |
| I ................. | J .............. | ශිල්පී සිසිර සේනාරත්න | K .............. | "රේඛාව" සඳහා බෙම්ටෝ තාලයට $\left(\frac{6}{8}\right)$ අනුව ගැයූ ගීයක් වීම |
| L ................. | M .............. | N ................. | ස්වතන්ත්‍ර | කෙහෙර්වා $\left(\frac{4}{4}\right)$ සහ දීප්චන්දි $\left(\frac{7}{8}\right)$ තාල දෙක ඇසුරු කරගත් "සත් සමුදුර" තේමා ගීතය |

(i) ඔබ දන්නා තොරතුරු ඇසුරෙන් වගුවෙහි ඇති හිස්තැන් පුරවන්න. (ඉංග්‍රීසි අක්ෂරය ලියා, ඊට ඉදිරියෙන් හිස්තැනට අදාළ පිළිතුර ලියන්න.) (ලකුණු 07 යි.)

(ii) 'රේඛාව' සිංහල චිත්‍රපට සංගීත ඉතිහාසයේ වැදගත් සන්ධිස්ථානයකි. අනුකාරක චිත්‍රපට සංගීතය පිළිබඳ සාකච්ඡා කරමින් රේඛාව චිත්‍රපට සංගීතය පිළිබඳ ව විමසුමක යෙදෙන්න. (ලකුණු 07 යි.)

(iii) "උත්තර භාරතීය රාගධාරී සංගීතය ඇසුරෙන් ප්‍රතිනිර්මාණය වූ සිංහල සරල ශාස්ත්‍රීය ගී, මෙරට ශ්‍රාවකයින් අතර බෙහෙවින් ජනප්‍රිය වී ඇත." ඔබ දන්නා සරල ශාස්ත්‍රීය ගීතයක සාහිත්‍යමය හා සංගීතමය ලක්ෂණ මතු කරමින් විමසුමක යෙදෙන්න. (ලකුණු 06 යි.)

**8.** 

(i) ඉහත අපරදිග ස්වර ප්‍රස්තාරය පෙරදිග ක්‍රමයට ස්වර ප්‍රස්තාර කරන්න. (ලකුණු 04 යි.)

(ii) එම අපරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ "ටයිම් සිග්නේචරය" (Time signature) සහ පෙරදිග ස්වර ප්‍රස්තාරයට අදාළ හින්දුස්ථානි තාලයේ නම ද ලියන්න. (ලකුණු 02 යි.)

(iii) අපරදිග සංගීත භාණ්ඩ වර්ගීකරණය පිළිබඳ ළමා සඟරාවකට සුදුසු ලිපියක් සකසන්න. ඒ සඳහා පහත සඳහන් කරුණු ද සැලකිල්ලට ගන්න.

- දළ රූපසටහනක් දක්වමින් වර්ගීකරණය පෙන්වීම
- එක් එක් වර්ගයට අදාළ ව සංගීත භාණ්ඩයක් බැගින් නම් කිරීම (ලකුණු 10 යි.)

(iv) අපරදිග සංගීතයෙහි හඬතල **හතර** පෙළගස්වා, වයලින් පවුලේ භාණ්ඩ ඊට ගැළපෙන ලෙස නම් කරන්න. (ලකුණු 04 යි.)

***